**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L

# පුරප්පාඩු

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** තනතුර : **තොරතුරු සහකාර iii ශ්‍රේණිය (පුරප්පාඩු 03)**

**සේවා ගණය** : කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය (MA 2 – 1)

**වැටුප් පරිමාණය** : MA 2-1-2025 රු:50,540-10x540-07 x 630-04x890-20x1,190- 87,710/=(මාසික) (ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:43,379/=ක්ද, 2026.01.01 දිනට රු:46,960/=ක්ද සහ 2027.01.01 දින සිට රු:50,540 /=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:18 ට නො අඩු හා අවු:35 ට නො වැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
  i. සිංහල / දෙමළ භාෂාව
  ii. ගණිතය
  iii. ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03)ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ මාස තුන(03)කට නො අඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ මණ්ඩලය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වීම.

**තාක්ෂණික නිපුනතා / ප්‍රවීණතා**

පිළිගත් විශ්වවිද්‍යාලයක / ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන්(03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. (අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන (PL 1), අර්ධ ශිල්පීය (PL 2) හා ශිල්පීය(PL3) සේවා ගණයක වසර පහ(05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
   (ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
     i. සිංහල / දෙමළ භාෂාව
     ii. ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවතාවකට නො වැඩි වාර ගණනක දී විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.
   (ඇ) පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ මාස තුන(03)කට නො අඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ මණ්ඩලය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වීම.
   (ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයක / ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර සමත්ව තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් ගෙන් සහ 30%ක් අභ්‍යන්තර අයදුම්කරුවන් ගෙන් ද වන අනුපාතයට බඳවා ගැනීම් සිදු කෙරේ.

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**සේවා කොන්දේසි :**

1. මෙම තනතුර ස්ථිර වන අතර, අවුරුදු තුන(03)ක පරිවාස කාලයකට යටත් වේ.
2. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8%ක් ගෙවිය යුතු අතර, සේව්‍යයා විසින් 12%ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3%ක්ද ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු සඳහා රාජකාරි ස්ථානය - කොළඹ**

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු තම අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකු ගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකය ද ඇතුළත් කර අයදුම්පත අදාළ සහතික වල පිටපත් ද සමඟ "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත - කොළඹ 07" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.06.05 දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය. අයදුම්පත් එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර තිබිය යුතුය.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරනු ලබන අයදුම්කරුවන් ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තුව / ආයතන ප්‍රධානියා ගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වා ඇති සියලුම අවශ්‍යතා සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති<br>
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය<br>
අංක 14, නිදහස් මාවත - කොළඹ 07.<br>
Website : www.natlib.lk